# දුෂ්පඨනත්‍වයට ප්‍රත්‍යක්ෂ ප්‍රතිකර්මය බෞද්ධ මනෝවිද්‍යාව විසින් සැපැයෙයි ද?

දිලාන් පංචන ජයසිංහ[1]

දුෂ්පඨනත්‍වය හෙවත් Dyslexia – ඩිස්ලෙක්සියා (Developmental reading disorder) (වාක්පරිචය පිළිබඳ මනෝවිකසනයෙහි පවත්නා අබාධික තත්‍වයක් මින් අදහස් කෙරේ. Dyshk ග්‍රීක භාවිතයෙහි ඉංගිරිසි යෙදුම ඃසසෙඑජමකඑභ යි. සිංහලයේ දී 01. දුෂ්, දුශ්, දුස්, දුර්, දුඃ යන හීනාත්‍ථවත් උපසර්ගපදයක් ලෙසත්, 02. පලුදු හා 03. දුෂ්කර අත්‍ථයෙනුත් සිටී. Lexia=Lexis - /'leksIs/ all the words and phrases of a particular language, Vocabulay - 01. වචන, 02. වචන කෝෂය, වාක්සංහිතාව, වාක්කෝෂය, 03. භාෂාවක මුළු වචන සමූහය හැඳින්වීම සඳහා යෙදේ. මෙම Dys+Lexia යන්නෙන් Dyslexia (dys-lexia /dIs'leksi□/ a slight DISORDER of the brain that causes difficulty in reading and spelling, for example, but does not affect intelligence) යන යෙදුම සකසා ගෙන ඇත. එහෙයින් ඃහිකැංස් යනු කියැවීමේ හා අක්ෂර වින්‍යාසයේ දුෂ්කරතාව උපදවන මොළයේ ආබාධයකි. මෙය මනෝව්‍යාධියක් හෙවත් මානසික රෝගී තත්ත්වයක් සේ නො සලකයි. Difficulty with words යනුවෙන් ගෙන 'වචන අන්‍ධතාව' නමින් හඳුන්වනුයේ ද දුෂ්පඨනත්‍වය නමැති මෙකී ආබාධික තත්‍වය මැ යි. (The word dyslexia comes from the Greek words "dys", which means difficulty, and "lexis", which means word or speech.) මුඛරි බවෙහි හා ව්‍යක්ත බවෙහි ඌනසංවර්‍ධිත බව හා පරිග්‍රහ විරෝධය හෝ උද්ග්‍රහණයෙහි අපරිපූර්‍ණ බව මෙම ආබාධික තත්‍වයෙහි මුඛ්‍ය ලක්‍ෂණයෝ යි. තව ද පොදු ලක්‍ෂණ වශයෙන්,

- ස්වරයන්ගේ යෙදීම පිළිබඳ නිසි පරීක්‍ෂාවක් නො මැති වීම.
- ස්වර සැකසුමෙහි ජවය හීන වීම. එනම්, අකුරු ගැට ගසා ගැනීමෙහි දුෂ්කරතාව.
- ඒ හේතුවෙන් විශේෂයෙන් කියැවීමේ දී ඇතිවන කැළැඹීම - විසංකේතීකරණය)
- භාෂා ශක්‍යතාවෙහි, අක්ෂර වින්‍යාසයෙහි, වචන ග්‍රහණයෙහි හා නම් තැබීමෙහි ඇති දුෂ්කරතාව.
- ඇසීම හෝ දැකීම තුළින් ලබා ගන්නා කෙටි කාලීන මතකය පවා ගිලිහී යාම.
- දක්වනු ලබන හෝ ගනු ලබන අදහස් අතර පවතින අසම්බන්‍ධය.
- විධානයන්හි පසුබැසීම.

ආදිය ද හඳුනා ගත හැකි ය.

ඔස්වල්ඩ් බර්ඛාන්, රුඩොල්ෆ් බර්ලින්, ඩබ්.ප්‍රින්ගල් මෝ(ර්)ගන්, ජේම්ස් හින්ෂෙල්වුඩ්, සැමුවෙල් ටී. ඔ(ර්)ටන්, ගැලබ(ර්)ඩ(ර්), කෙම්ප(ර්) ආදීන් විසින් මේ පිළිබඳ වැදගත් භූමිකාවන් අනාවරණය කර දීමට මේ තාක් සමත් විය. එසේ ම, ඒ ඇසුරින් සකස් වුණු විශේෂ අධ්‍යාපන ආයතන හා වෙනත් ප්‍රතිකර්ම ද වේ. තවදුරටත් විද්‍යාත්මක පර්යේෂණ පුළුල් කෙරෙමින් හා අත්හදා බලමින් පවතී. නිශ්චිත ප්‍රතිකර්මය මේ යැ'යි ද නියමයෙක් නැත. ආබාධයෙහි ස්වරූපය හඳුනා ගෙන ඇතිවා විනා ඊට බලපෑ

1 දෙවන වසර -පාලි විශේෂවේදී උපාධි අපේක්‍ෂක, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මූලික හේතුව ද නිශ්චය වී නැත. මේ කෙරී ඇති සෑම පර්යේෂණයකින් ම සපයා දුන් ප්‍රතිකර්මවල අපේක්ෂාව ආබාධිතයා ආබාධිකතාවෙන් මග හැර සාමාන්‍යය පරිදි දෛනික කටයුතුවල නිරත වීමට සැලැස්වීම යි. එය යම් මට්ටමක සාඵල්‍යභාවයක් පෙන්නුම් කරයි.

කෙසේ වෙතත් විශේෂයෙන් කිව යුතු වන්නේ දුෂ්පඨනත්‍වය වනාහි කිසි සේත් ම මන්‍දබුද්ධිකතාවක් නො වන බව යි. විවිධ හේතුසාධක මත වම් මොළයේ ක්‍රියාකාරීත්‍ව යට බාධා පැමිණීම නිසා ඇතිවන දුෂ්කරතාවකි. ඉන් බුද්ධියට ඇති කරන බලපෑමක් නැත. මන්දයත්, දකුණු මොළයේ ක්‍රියාකාරීත්‍වය සාධාරණ වන හෙයිනි. අප විසින් එවන් පරිච්දිතයක පිහිටා පිරියෙසුම් කෙරුණෙමු. දකුණු මොළයෙහි කුශල පක්ෂය නංවාලීමෙන් වම්මොළයෙහි ආබාධික තත්ත්‍වය මඟ හරවා ගත නො හැකි දැ'යි යන්න අපගේ පැනය ය. ඒ කෙරේ මේ තාක් මනෝවිද්‍යාඥයන්ගේ ස්ථිර අවධානය යොමු ව නැත. තවද, ආබාධිතයා සාමාන්‍යය මට්ටමට පත්කරවාලීමෙහි මතු නො ව, අතිවිශිෂ්ටයන් අතුරෙහි අතිවිශිෂ්ටයෙකු බවට පැමිණවිය නො හැකි දැ'යි යන වග ද විමසන ලදි. අනෙක නම් ආබාධයට නියම හේතුවය ය. බටහිර මනෝවිද්‍යාව විසින් මේ තාක් නො සමත්කම් දක්වා ඇති මේ භූමිකාව බෞද්ධ මනෝවිද්‍යාව විසින් අනාවරණය කෙරෙයි ද? සැබැවින් ම දුෂ්පඨනත්‍වයට ප්‍රත්‍යක්ෂ ප්‍රතිකර්මය බෞද්ධ මනෝවිද්‍යාව විසින් සැපැයෙයි ද? චුල්ලපන්‍ථක ථෙරාපදානය ඇතුළු පාලිමූලාශ්‍රය භාවිතයෙන් එය පිරියෙසුම් කරමු.

**ප්‍රමුඛ පද :**